# සාමාන්‍ය සමයේ දස අටවන සතිය
# බදාදා

## පළමුවන කියැවීම

ගණන් කතාවෙන් ගත් පාඨයෙකි.

**13: 1-2, 25-14 : 1, 26-29, 34-35**

"රමණීය වූ ඒ දේශය ඔව්හු ප්‍රතික්ෂේප කළෝය."

සමිඳාණන් වහන්සේ මෝසෙස්ට කතා කොට, "මා ඉශ්රායෙල් ජනයාට දෙන්නට යන කානාන් දේශයට චර පුරුෂයන් යවන්න. නුඹලාගේ පිය ගෝත්‍ර සැම එකකින්ම එක්කෙනා බැගින් ඔවුන් අතර මූලිකයන් වන අය යවන්නැ"යි වදාළ සේක.

දවස් සතළිසකට පසු ඔව්හු රටේ ඔත්තු බලා ආපසු පැමිණියහ. පාරාන් නම් පාළුකරයේ කාදේෂ් නම් ස්ථානයේ සිටි මෝසෙස්, ආරොන් සහ මුළු ඉශ්රායෙල් ජනතාව වෙත ඔව්හු පැමිණ, ඔවුන් සියල්ලන්ට රටේ යථා තත්ත්වය වාර්තා කර, තමන් ඒ රටින් ගෙනා පලතුරු පෙන්වූහ. ඔව්හු මෝසෙස් අමතා, "ඔබ අප යැවූ දේශයට අපි ගියෙමු. ඇත්තටම ඒ නම් කිරෙන් හා මී පැණියෙන් ඉතිරෙන රටකි. මෙන්න, එහි පලතුරු. එහෙත් ඒ දේශවාසීහු බලසම්පන්න ය. ඔවුන්ගේ නගර පවුරුවලින් වටකොට ඇත. ඒවා අති විශාලය. ඇරත් අපි එහිදී අනාක්ගේ දරු මුනුබුරන් ද දිටිමු. අමලෙක්වරු රටේ දකුණු දිශාවේ වාසය කරති. හිත්තිවරු හා ජෙබුසිවරු, අමෝරිවරු කඳුකරයේ වාසය කරති. කානානිවරු මුහුදුබඩ ද ජෝර්දාන් ගඟ අසබඩ ද වාසය කරති"යි කීහ.

එවිට කාලෙබ්, මෝසෙස්ට විරුද්ධව මැසිවිලි කී සෙනඟ නිහඬ කරමින් "අපි වහාම ගොස් එය හිමි කර ගනිමු. ඔවුන් පරාජය කිරීම පහසුවෙන් ම කළ හැකියැ"යි කීය.

එහෙත්, ඔහු සමඟ ගිය සෙසු චර පුරුෂයෝ කතා කරමින්, "සෙනඟ පරාජය කිරීමට තරම් අපි බලසම්පන්න නොවන්නට පුළුවන. ඔව්හු තමන් ඔත්තු බැලූ රට ගැන අසත්‍ය වාර්තාවක් ඉශ්රායෙල් ජනයාට දෙමින්, "අපි ඔත්තු බැලීමට ගිය රට නම් වැසියන් කා දමන රටකි. එහි අප දුටු මිනිස්සු සියල්ලෝ ම උස මහත මිනිස්සු ය. එහි දී යෝධයන්ට නැකම් කියන අනාක්ගෙන් පැවතෙන් යෝධ පරපුරක් දුටිමු. ඔවුන් ඉදිරියෙහි අප පළගැටියන් මෙන් අපට ම පෙනුණේ ය. අප ද ඔවුන්ටත් එලෙසම පෙනෙන්නට ඇතැ"යි කීය.

එදින රාත්‍රියේ මුළු සෙනඟ ම ශබ්ද නගා කෑ ගසමින් හඬන්නට වූහ.

සමිඳාණන් වහන්සේ යළි මෝසෙස්ට සහ ආරොන්ට කතා කොට, "මට විරුද්ධව මැසිවිලි කියන මේ නපුරු ජනතාව ගැන මම කොපමණ කල් ඉවසම් ද? ඉශ්රායෙල් ජනයා මට විරුද්ධව කී මැසිවිලි මා අසා ඇත. එබැවින් ඔබ ඔවුන් අමතා මෙසේ කියන්න. "නුඹලා මාගේ කනට ඇසෙන සේ කී ලෙස මා නුඹලාට කරන බවට මාගේ නාමයෙන් මම දිවුරමි"යි සමිඳාණන් වහන්සේ වදාරන සේක. ජන සංගණනයේ දී ලියාපදිංචි කළ, වයස අවුරුදු විස්සක් හා ඊට වඩා වයසැති මට විරුද්ධව මැසිවිලි කී සියල්ලෝම මේ පාළුකරයේ ම නසිනු ඇත.

නුඹලා ඒ රටේ ඔත්තු සෙවූ කාලය දවස් හතළිහක් නොවේ ද? හැබැයි, එක එක දවසකට එක එක අවුරුද්ද බැගින් සලකා අවුරුදු හතළිහක් තුළ නුඹලාගේ දුෂ්ටකම්වලට වග කියමින්, මාගේ පොරොන්දු කඩ කිරීමේ විපාකයේ බරපතලකම කොතරම් ද කියා දැනගන්නහු ය. මෙය වදාළේ සමිඳාණන් වහන්සේ වන මම ය. මට විරුද්ධව පෙරමුණු බැඳගත් මේ මුළු

නපුරු ජනතාවටම මම සත්තකට ම දඬුවම් කරමි. මේ පාළුකරයේ ම ඔවුන් නැති නාස්ති වී වැනසී යනු ඇතැ"යි වදාළ සේක.

දේව වාක්‍යය එසේය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 106: 6-7, 13-14, 21-23

පිළිතුර: සමිඳුනි ඔබ වහන්සේගේ කරුණාවෙන් අප සිහි කළ මැනව.

ගීය:

අපි අපේ පියවරුන් මෙන් පව් කළෙමු. නපුරුකම් කළෙමු.
දුෂ්ට ලෙස ක්‍රියා කළෙමු. අපේ පියවරු මිසරයේ දී ඔබේ පුදුම ක්‍රියා
තේරුම් නොගත්තෝ ය. ඔබේ අසීමිත ප්‍රේමය සිහි නොකළෝය.
රතු මුහුද ළඟ දී මහෝත්තමයාණන්ට විරුද්ධව කැරලි ගැසුවෝය.

ඔහු එතුමන්ගේ ක්‍රියා වහා අමතක කළෝය. එතුමන්ගේ අවවාද නොතකා ක්‍රියා කළෝය.
ඔව්හු පාළුකරයේ දී අධික ලෙස තෘෂ්ණාවෙන් පිරී දෙවිඳුන්ට අභියෝග කළෝය.

මිසරයේ දී බලවත් ක්‍රියා කර, ඔවුන් ගලාගත් දෙවිඳුන් අමතක කළෝය. එතුමාණෝ ඒ දේශයේ දී අරුම පුදුම ක්‍රියා ද රතු මුහුද ළඟ බියකරු ක්‍රියා ද කළ තැනැත් වහන්සේ නොවන සේක් ද?

එබැවින් එතුමාණෝ ඔවුන් විනාශ කරන බව වදාළ සේක. එහෙත් එතුමාණන් ඔවුන් විනාශ නොකරන ලෙස දේව උදහස පහ කරන

පිණිස එතුමාණන් තෝරාගත් මෝසෙස් එතුමාණන් ඉදිරියේ මැදහත් වූයේ ය. දේව කෝපයෙන් ඔවුන් විනාශ කිරීම වැළැක්වීය.

## සාධුකාරය (දෙවසරේම)

ආලේලූයා! ආලේලූයා!
දෙවියන් වහන්සේ මැවූ සත්ත්වයන් අතර අප මුදුන් මල්කඩ වීමේ පෙර ලකුණු වශයෙන් සිය අරමුණු අනුව උන්වහන්සේ සත්‍ය වචනයෙන් අප ජනිත කළ සේක.
ආලේලූයා!

තොහොත්

ආලේලූයා! ආලේලූයා!
ශ්‍රේෂ්ඨ දිවැසිවරයෙක් අප අතර පහළ වී සිටී.
දෙවියන් වහන්සේ සිය සෙනඟ ගළවන්නට වැඩිය සේක.
ආලේලූයා!

# සුවිශේෂය

සුවිශේෂක මතෙව් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

මතෙව් 15: 21–28

"ස්ත්‍රිය ඔබේ ශ්‍රද්ධාව මහත් ය."

ජේසුස් වහන්සේ නික්ම තීර් හා සීදොන් පෙදෙස් වලට වැඩිය සේක. එක් කානානීය ස්ත්‍රියක් ඒ පෙදෙස් වල සිට අවුත්, "දාවිත්ගේ පුත්‍ර වූ ස්වාමිනී, මට අනුකම්පා කළ මැනව. මාගේ දුව බලවත් සේ යක්ෂාවේශව සිටින්නී ය"යි කීවාය. එහෙත් උන්වහන්සේ ඇයට වචනයකින් වත් පිළිතුරු නුදුන් සේක. උන්වහන්සේගේ ශ්‍රාවකයෝ අවුත්, "මේ ස්ත්‍රිය මොර ගසමින් අප පස්සේ එන බැවින්, ඇයට යන්න කිව මැනවැ"යි උන්වහන්සේගෙන් ඉල්ලූහ. උන්වහන්සේ කතා කරමින් "මා එවන ලද්දේ ඉශ්රායෙල් වංශයේ නැතිවූ බැටළුවන් වෙත පමණකැ"යි වදාළ සේක.

එහෙත් ඈ අවුත් පසඟ පිහිටුවා උන්වහන්සේට වැඳ, "ස්වාමිනී, මට පිහිට වුව මැනව"යි කීවාය. උන්වහන්සේ උත්තර දෙමින් "දරුවන්ගේ කෑම ගෙන බල්ලන්ට දැමීම යුතු නැතැ"යි වදාළ සේක. එහෙත් ඈ කතා කොට "එසේය, ස්වාමිනී, බල්ලන් පවා තම ස්වාමිවරුන්ගේ මේසයෙන් වැටෙන කැබලි අවුලා කති"යි කීවාය. එවිට ජේසුස් වහන්සේ උත්තර දෙමින්, "ස්ත්‍රිය, ඔබේ ශ්‍රද්ධාව මහත් ය. ඔබේ කැමැත්ත ලෙසම ඔබට වේවා"යි වදාළ සේක. ඒ මොහොතේ පටන් ඇගේ දුව සුවපත් වූවා ය.

සුවිශේෂ වාක්‍යය එසේය.